# අජිත් තිලකසේන කෙටිකතා

## කුලතිලක කුමාරසිංහ[1]

කතා පුවතට ප්‍රමුඛත්වය දෙමින් රචනා කෙරුණු සාම්ප්‍රදායික සිංහල කෙටිකතාව, නව මගකට යොමු කිරීමට නැඹුරු වූ සිංහල කෙටිකතාකරුවා වන්නේ අජිත් තිලකසේන ය. ඔහු විසින් දැනට **සතුරෝ, පිටුවහල් කර සිටිද්දී, සුන්නද්දූලි, රාත්‍රියේ පූර්වභාගය, සුබරාත්‍රියක් අභවරයි. සාදය, වන්දනාව, සුසුම හා පීඩාව, අරුනැල්ල වැටෙන කොට විතර** යනුවෙන් කෙටිකතා සංග්‍රහ අටක් පළකරනු ලැබ ඇත. කෙටිකතාව වින්දනාත්මක මාධ්‍යක් ලෙස හැසිරවීම ඔහුගේ අභිමතාර්ථය විය. සමාජ යථාර්ථය නිරූපණය කිරීම කෙටිකතාකරුවාගේ අභිමතාර්ථ සාධනයක් ලෙස සැලකීමට ඔහු නොපෙලඹුණේය. කෙටිකතාකරුවාගේ සුවිශේෂත්වය රඳා පවතින්නේ ආකෘතිය හා ශිල්පීය ක්‍රම මත බව ඔහු විශ්වාස කළේය. ඔහුගේ කතාවල පුද්ගලයන් හා ඔවුන්ට ජීවිතයෙහි පැන නගින ගැටලු, ප්‍රශ්න හා ජීවන දුෂ්කරතා මෙන් ම, පැහැදිලි ලෙස හැඳිනගත හැකි චරිත ද දක්නට නොලැබේ. ඒ වෙනුවට තිලකසේනගේ කෙටිකතාවලින් ගොඩ නැගී ඇත්තේ පුද්ගලයකුගේ සේයාවකි. නැතහොත් හැඟීමක්, අරගලයක් හෝ ආසාවක් පිළිබිඹුවක් පමණි. මෙලෙස තිලකසේන වැඩි අවධානයක් යොමු කර ඇත්තේ චෛතසික අභ්‍යන්තර ගැටලු හා ප්‍රශ්න කෙරෙහි ය. සුපුරුදු චරිත හා ස්ථිරව හැඳිනගත හැකි පරිසරය වෙනුවට අපට දක්නට ලැබෙන්නේ සිමෙන්ති පොළොවේ අතහැරුණු චිම්නියක් මෙන් විසිරී යන, බිඳ වැටී යන විඥානයකි. එය විග්‍රහ කරමින්, ව්‍යවච්ඡේදනය කරමින්, එම විසිරීම බිඳ වැටීම වලක්වා ගන්නට, ඒ තුළ සිට ගෙවී යන ජීවිතය පිළිබඳ යම්කිසි කේන්ද්‍රයක්, ශක්තියක්, ධර්මතාවක් සාපේක්ෂ වශයෙන් හෝ වටහා ගන්නටත්, අර්ථයක් ඩැහැ ගන්නටත් කරනු ලබන ප්‍රයත්නයකි. මෙබඳු පුද්ගලික, චෛතසික හා මානසික චිත්ත ආභ්‍යන්තරික ප්‍රශ්න හා ගැටලු ඇසුරින් නිශ්චිත විසඳුමක් හා අවසානයක් ඇති කතාවකින් අප සිත්

[1] මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
ඊමේල්: kula@kln.ac.lk

සැහැල්ලු කිරීමට පෙලඹී නැත. ඒ වෙනුවට ඔහු ගැටලුවක්, අරගලයක් ඇති පරිසරයක්, ක්ෂේත්‍රයක් ඇතුළට පාඨකයා ඇතුළු කර ඔහුට ඒ ගැටලුව. අරගලය හෝ හැඟීම හෝ තත්ත්වය වින්දනය කිරීමට ඉඩප්‍රස්තාව සලසා දෙයි. සාම්ප්‍රදායික කතා කලාවට ආවේණික වූ වටකුරු කතා පුවතක් හා බැඳුණු චරිත හා සම තත්වයක සිටින චරිත තිලකසේනගේ කෙටිකතා මගින් දක්නට නොලැබුණ ද තමා නිරූපණය කිරීමට බලාපොරොත්තු වන චරිතවල අභ්‍යන්තරයට පිවිස ඔවුන්ගේ සිත්වල පතුලෙහි සැඟ වී ඇති සිතුවිලි මතුපිටට එනම් පාඨකයා ඉදිරියට ගෙන ඒමට තිලකසේන සතුව ඇත්තේ පැසසුම් කටයුතු කුසලතාවකි, ඔහු සිය කෙටිකතා මග වෙනස් කිරීමට යම් උත්සාහයක් **සාදය** කතා සංග්‍රහය රචනයෙන් පෙලඹුණ ද එය සාර්ථක අත්හදා බැලීමක් නොවීය.

**ප්‍රමුඛ පදඃ** සිංහල කෙටිකතා, අජිත් තිලකසේන, කෙටිකතා විචාරය

**Title:** Ajith Thilakasena's short stories

**Keywords:** Sinhala short story, Ajith Thilakasena, short story criticism